**සංශෝධනයයි**

ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

**ග්‍රාම නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය - 2020 (2021)**

අංක 2,230 දරන 2021.05.28 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද ග්‍රාම නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය - 2020(2021) විභාග නිවේදනය හා බැඳේ.

02. එම නිවේදනයෙහි 9.1 ඡේදයෙහි සඳහන් අයදුම්පත් කැඳවන අවසන් දිනය 2021.07.19 දින දක්වා දීර්ඝ කරන අතර, **එහි 6 ඡේදයෙහි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ යුතු දිනය 2021.06.28 ලෙස නොවෙනස්ව පවතී.**

03. තවද, මෙම විභාගය සඳහා මාර්ගගත ක්‍රමයට අයදුම්පත් යොමු කිරීමට අවශ්‍ය පහසුකම් සලසා ඇත. ඒ සඳහා www.doenets.lk යන වෙබ් අඩවියෙහි අවශ්‍ය උපදෙස් පළ කර ඇති අතර, එම වෙබ් අඩවියට පිවිස එහි සඳහන් උපදෙස් අනුව අයදුම් කිරීමට කටයුතු කරන්න.

04. මෙම විභාගය සඳහා මේ වන විටත් අයදුම්කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම්පත් එවීමෙන් වළකින ලෙස දනුම් දෙනු ලැබේ.

එන්. එච්. එම්. චිත්‍රානන්ද,<br>
ලේකම්,<br>
ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය.

2021 ජූනි මස 04 වැනි දින,<br>
ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය,<br>
''නිල මැදුර'', ඇල්විටිගල මාවත,<br>
කොළඹ 05.